14 වන පිටෙන්

කර දැමීම ඔවුන්ගේ ඉලක්කයයි.

මෙයට සමගාමීව ගෙවල ඇතිකරන සුරතල් 'පූසන්' රැක ගැනීම සඳහාද ඉතාමත් සත්ත්ව හිතකාමී වැඩපිළිවෙලක් යෙදවීම පිණිස ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ මොනෑෂ් කවුන්සලය පියවර ගෙන තිබේ. එය නම්කර ඇත්තේ 'බළලුන් සඳහා ඇඳිරි නීතියක්' (*A cat curfew*) යනුවෙනි.

මොනෑෂ් ප්‍රාදේශීය කවුන්සලයේ 2019 මාර්තු නිල පුවත් නිවේදනයට අනුව 'බළල් ඇඳිරි නීතිය' පිලිබඳ දැනුවත් කිරීමක් කර තිබේ.) ඡායාරූපයේ දැක්වෙන පරිදි එම නිවේදනයේ අවසාන කොටස මෙසේය:

"Cats are great companins to many residents in Monash' However" they are also natural predators and if they are left to roam at night they can do enermous dmage to native wildlife and be a nuisance to residents" and that is of concern to Council'

The 'cat curfew' is one of a number of measures in Council's Domestic Animal Management (DAM), plan which was adopted at the 31 st October 2017 Council meeting.

There are 4,664 registered cats in Monash. (www.monash.vic.gov.au)

මේ ආකාරයට 'බළල් ඇඳිරි නීතිය' ක්‍රියාත්මක කර, බළලුන් ගෙවල් වලට කොටු කර තැබීම සඳහා අයිතිකරුවන් දැනුවත් කිරීම සඳහා, මාධ්‍ය හරහා විශාල ප්‍රචාරයක් දී තිබේ. මේ මගින් බලාපොරොත්තු වන්නේ රාත්‍රී කාලයේ දඩාවතේ යමින්, විලොපියයන් ලෙස හැසිරෙමින්, අනිකුත් සතුනට පීඩාකාරී වන බළලුන් මර්දනය කර ගැනීම සඳහා සුදුසු පියවර ගැනීමට ඉඩකඩ සලසා ගැනීමයි.

වන වැදී සිටින පීඩාකාරී බළලුන් මර්දනය කිරීම සඳහා විවිධ ක්‍රමෝපායයන් භාවිත කරනු ලැබේ. වෙඩි තැබීම, උගුල් ඇටවීම සහ මරණීය විෂ සහිත ආහාර දීම මගින් මෙම බළල් ගහණය තුනී කර ගැනීමට මහත් උත්සාහයක් ගනිමින් සිටින බව දකින්නට ලැබේ.

මීට පෙරද, 1907 දී පමණ, සංක්‍රමණිකයින් විසින් ගෙනෙන ලද, රටහාවුන් (*rabbits*) ශීඝ්‍රයෙන් බෝවීම නිසා, ඕස්ට්‍රේලියාවේ පාලනය කර ගත නොහැකි වූ හාවුන්ගේ ගහණයක් නිසා, මෙවැනිම විපතක් සිදුවී ඇති බවටද වාර්තාවේ. එම අවස්ථාවේදී, බටහිර ඕස්ට්‍රේලියාවේ ශීඝ්‍රයෙන් බෝ වීමට පටන්ගත් හාවුන් රටෙහි අනිකුත් ප්‍රදේශ වලට සංක්‍රමණය වීම වැලැක්වීම පිණිස, හාවුන්ට රිංගා යාමට නොහැකි වැටවල් තුනක් ප්‍රාන්ත මායිමේ ඉදි කරන්නට සිදුවිය. වසර හයක් තිස්සේ එසේ ඉදිකරන ලද වැටවල් වල දිග කිලෝමීටර් 3,256 ක් විය. මෙයින්, කිලෝමීටර් 1,139 ක් දිගින් යුත් වැට, ලෝකයේ දිගම වැට ලෙස වාර්තාවක්ද පිහිටුවන ලදී. ඒ කාලයේ මෙම වැටෙහි කිලෝමීටරයක් ඉදි කිරීම සඳහා ඩොලර් 250 පමණ වැයවූ බවද සටහන් කර ඇත.

යම්කිසි පරිසරයක සමතුලිත බව පවතින්නේ සහ එයට හානි සිදුවන්නේ කෙසේද?

- **සීමිත විලොපියයන් පමණක් සිටීම**
  ඕස්ට්‍රේලියාවේ, මහා සාගරය නිසා භූ ගෝලීයව සෙසු ලෝකයෙන් දුරස් වී තිබෙන මහාද්වීපයයි. මෙහි සත්ත්ව පරිණාමයද තරමක් 'සෙමින්' සිදුවී ඇති නිසා ආදී කාලීනයින් යයි සැලකෙන *Worfhameila* (*pouch*) සහිත, කැන්ගරු සහ වොලබි වැනි සේපාටිකයින් (*marsupials*) තවමත් නිරුපද්‍රිතව සිටිති. මොවුන්ගේ ගහණය ස්වභාවිකව පාලනය වේ. එසේම උභය ජීවීන්, උරගයින් සහ පක්ෂීන් වැනි දේශීය සතුන්ගේ ගහණද, දේශයට ආවේණික විලෝපියයන්ගේ බලපෑම නිසා ස්වාභාවික සමතුලිත බවකින් පවතී.

- **මාංශ භක්ෂක බළලා ආගන්තුක විලෝපියයෙක**
  කුඩා සතුන් දඩයම් කිරීම සඳහා අනුවර්තන සහිත බළලා ඕස්ට්‍රේලියාවේ ආවේනික සත්ත්ව ප්‍රජාවට විලෝපියයෙකි. ආගන්තුක විලෝපියයාගේ ග්‍රහණයෙන් මිදියාම සඳහා දේශීය සතුන්ට අනුවර්තන නොමැත. මේ නිසා පහසුවෙන්ම ඔහුගේ ග්‍රහණයට හසුවේ.

- **සම්පත් සූරාකෑම සහ අධික බෝවීම**
  බාහිර බාධක නොමැති විට ආගන්තුක විලෝපියයා පරිසරයේ ඇති සතුන් අධික ලෙස ගොදුරු කර ගනිමින් ශීඝ්‍ර ලෙස තම වර්ගයා බෝ කිරීමට පටන් ගනී.

- **ආගන්තුකයා තමන්ට ගැලපෙන පරිදි පරිසරය වෙනස් කිරීම**
  ආගන්තුක විලෝපියයන් විසින් පරිසරයට ආවේනික සතුන් අධිකලෙස ගොදුරු කර ගැනීම සම්පත් සූරාකෑමකි. මේ නිසා ආවේණිනික දේශීය ගහණ ක්‍රමක්‍රමයෙන් තුනී වේ.

- **වෙනස් වන පරිසරය, දේශීය සතුන්ට හිතකර නොවීම**
  විලෝපියයන්ගේ බලපෑම නිසා විකෘති වන පරිසරය ආවේනික දේශීය සතුන්ට අහිතකර බවට පත්වේ.

- **ගහණය තුනී වී වඳවී යාම**
  වෙනස් වන පරිසරයට අනුවර්තනය වීමට නොහැකි වන දේශීය සත්ත්ව ගහණය ක්‍රමක්‍රමයෙන් තුනිවී ගොස් අවසානයේදී වඳවී යාමට තුඩු දේ.

මෙසේ සලකා බලන කළ, ඕස්ටශ්‍රලියාවේ ආරම්භ කර තිබෙන, මහා වන බළල් සංහාරය පරිසර විද්‍යාත්මකව, ඉතාමත් නුවණට හුරු, පරිසර සංරක්ෂණ ක්‍රමවේදයක් ලෙස සැලකිය හැකිය.

